# City NEWS

MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ නිළ ඊ පුවත් පත

කලාප 10

2023 අගෝස්තු 01


## සෑම ආයතනයක්ම ආදායම උපද්දවීමට සැලසුම් සකසන්න

### එසේ නොකරන නිළධාරීන් සම්බන්ධයෙන් තීන්දු ගන්නවා

(නිහාර පෙරේරා)

තම අමාත්‍යාංශය යටතේ ඇති සෑම ආයතන ප්‍රධානියෙකුම තමන්ගේ ආයතනය තුලින් වාර්ෂිකව ආදායම ඉපයීම සම්බන්ධයෙන් සැලසුමක් සකස් කරන ලෙස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා ආයතන ප්‍රධානීන්ට උපදෙස් දී තිබේ.



අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසන්නේ එසේ සැලසුම් සකස්කර ඒවා ක්‍රියාත්මක කර ආයතනවල ප්‍රගතියක් නොපෙන්වන නිළධාරීන් සම්බන්ධයෙන් තීන්දු ගැනීමට තමන් පසුබට නොවන බවයි.

පිටුව 02

## „ මෙම වසරේදී තානායම් ”

## නමින් තානායම් 100ක්

(නාලක සංජීව දහනායක)

මෙම වසර ඇතුළත සංචාරක ආකර්ෂණය ඇති ස්ථානවල තානායම නමින් තවත් තානායම් 100ක් ආරම්භ කරන්න කටයුතු කරන බව ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ ආයතනයේ සභාපති, දුලිප් විජේසේකර මහතා පවසයි.




පිටුව 02

## ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ

### මූල්‍ය වංචාවන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමින්

## විමර්ශණ

(නිහාර පෙරේරා)

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සිදුව ඇතැයි කියන මූල්‍ය වංචාවන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමින් විමර්ශණ සිදුකර කඩිනමින් තමන්ට වාර්තාවක් ලබාදෙන ලෙස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා එහි සභාපතිවරයාට උපදෙස් දී තිබේ.

මෙලෙස මූල්‍ය වංචාවන් සිදුකර තිබෙන්නේ නිවාස ණය එකතු කිරීමේ කටයුතුවල නිරතව සිටි බාහිර ණය එකතු කිරීමේ නිළධාරීන් හා ස්ථිර සේ-වකයන් පිරිසකි.

පිටුව 02

## අතහැර දමා ඇති වැඩබිම් ආශ්‍රිතව අනතුරු සිදුවීම වළක්වන්න

### ඇමති ප්‍රසන්නගෙන් අමාත්‍යංශ ලේකම්ට උපදෙස්

(නාලක සංජීව දහනායක)

ඉදිකිරීම් කටයුතු අතහැර දමා ඇති වැඩබිම් ප්‍රදේශය ආශ්‍රිතව මහජනතාවට අනතුරු සිදුවීමේ අවස්ථාවන් වළක්වා ඊට අවශ්‍ය ආරක්ෂිත පියවර කඩිනමින් ගන්නා ලෙස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා විසින් අමාත්‍යංශ ලේකම්වරයා ඇතුළු නාගරික සංවර්ධන අධිකාරියේ නිළධාරීන්ට නියෝග කර තිබේ.

පිටුව 02

## රටට ඩොලර් ගේන්න වෙරළින් වැඩ ගන්න යයි

(නිහාර පෙරේරා)

මෙරට මුහුදු තීරය වටා පිහිටි ආකර්ෂණීය ස්ථාන හඳුනාගෙන ඒ සඳහා දෙස් විදෙස් සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමේ කඩිනම් වැඩපිළිවෙලක් සකස් කරන ලෙස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ

පිටුව 02

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ City News නිළ ඊ පුවත්පත සඳහා පිවිසෙන්න

## තානායම ...

සංචාරක මණ්ඩලය හා පුද්ගලික අංශය සමඟ ගිවිසුම්ගතව මෙම තානායම් පවත්වාගෙන යෑමට නියමිතය. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.
ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ ආයතන නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි. එම ආයතනය යටතේ මේ වනවිට උතුරු නැගෙනහිර ඇතුළු දිවයිනපුරා තානායම් 25ක් ක්‍රියාත්මක වන බවද සභාපති දුලිප් විජේසේකර මහතා පවසයි.

## ආයතනයෙන් ආදායම ...

එමෙන්ම ආයතනයේ සේවක සංඛ්‍යාව, සිදුකරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් තමන්ට කඩිනමින් වාර්තාවක් ලබාදෙන ලෙසද අමාත්‍යවරයා උපදෙස් දී තිබේ.
ආයතන ආරක්ෂා කර ගැනීමට වෘත්තීය සමිති, සේවක සේවිකාවන්, නිළධාරීන් එකට එක්ව කටයුතු කළ යුතු බවයි. අමාත්‍යවරයා පවසන්නේ ඒ සඳහා නිළධාරීන්, සේවක සේවිකාවන් තුළ ආකල්පමය වෙනසක් සිදුකළ යුතු බවයි. එමෙන්ම ආයතනයේ සුබ සිද්ධිය වෙනුවෙන් ඇතැම්විට පරිපාලන රෙගුලාසිද වෙනස් කිරීමට සිදුවනු ඇතැයිද අමාත්‍යවරයා පවසයි.

# කතු වැකිය

මෙයට වසරකට පමණ පෙරදී අපට "පෝලිම්" දැකීම ඉතාම සුළබ කරුණක් විය. එමෙන්ම රට පුරාම උද්ඝෝෂණ, වැඩ වර්ජනද ඉතාම සුළබවිය. හැම අතින්ම ඇසුනේ මිනිසුන්ගේ අඳෝනාවන්ය. එසමයෙදී රට දෙස සුබවාදී ඇසකින් බැලීම ඉතාම අසීරු විය.
නමුත් වසරකට පසුව නැවත හැරී බැලීමේදී යම් පමණකට සතුටුවිය හැකිය. රටේ ආර්ථිකය යම් පමණකින් ස්ථාවර වෙමින් පවතී. එහෙත් හදාගතයුතු තැන් තවත් බොහෝමයක් ඇත.
රටේ සිදුව ඇති කඩා වැටීම දවසකින් දෙකකින් සිදුවූවක් නොවේ. නිදහසින් පසුව රටේ බලය හෙබවූ සියලුම ආණ්ඩු එයට අඩු වැඩි වශයෙන් වගකිව යුතුය. ජනාධිපතිවරයා රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට සවිමත් අඩිතාලමක් යොදා ඇති බව බැලූ බැල්මට පෙනේ. අවශ්‍ය වන්නේ එම අඩිතාලම මත ශක්තිමත් ගොඩනැගිල්ලක් සැකසීමට ඇවසි ශක්තිය ජනාධිපතිවරයාට ලබාදීමයි.

## උපදේශකත්වය
ඇමතිතුමාගේ මාධ්‍ය ලේකම්
ප්‍රදීප් අනුර කුමාර
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

## සංස්කරණය
නාලක දහනායක

## පිටු සැකසුම
ධනුෂිකා කුමාරි

## විශේෂාංග ලිපි
නාලක දහනායක
නිහාර චාමික පෙරේරා
අමිල දර්ශන හේරත්
මුනීරා අබු බක්කර්

## සෝදුපත් බැලීම
පී.බී.එස්. සම්පත්

## සම්බන්ධීකරණය
දිලිනි කෞෂල්‍යා
නදුන් තාරක
නිලංක නිරෝෂන්

## ඡායාරූප
නුවන් දිනේන්ද්‍ර
නලින් හේවාපතිරණ
සරත් ජයතිලක

## පරිගණක සහය
සචිඳු සංකල්ප
තිළිණ නිර්මාල්

## වැඩබිම් ආශ්‍රිතව අනතුරු ...

යම් ආකාරයකින් අනතුරක් සිදුවුවහොත් මෙහි වගකීම අමාත්‍යාංශය ඇතුළු රජයට පැවරෙන බැවින් මේ සම්බන්ධයෙන් කඩිනමින් පියවර ගත යුතු බවයි අමාත්‍යවරයා පවසන්නේ.
අත්හැර දමා ඇති වැඩබිම් ආශ්‍රිතව ජලය එක්රැස්වීම හේතුවෙන් මදුරුවන් බෝවීමේ හැකියාව පවතින බවත් හෙතෙම පැවසීය. මෙම වැඩබිම් පොළොව මට්ටමට පහළින් පැවතීම නිසා එහි වැසි ජලය එක්රැස්ව ඩෙංගු ව්‍යාප්ත වීමේ දැඩි අවධානමක් මතුව ඇති බවද අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පෙන්වා දුන්නේය.
ඒ පිළිබඳ අවට ප්‍රධාන පෙළේ සංචාරක හෝටල්වලින් සහ මහජනතාවගෙන් තමන්ට පැමිණිලි ලැබී ඇති බවද අමාත්‍යවරයා වැඩිදුරටත් අවධාරණය කළේය.

## මූල්‍ය වංචාවන් ...

ඒ අනුව දැනටමත් නිවාස ණය මුදල් පුද්ගලික පරිහරණයට යොදාත් හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයේ සේවයේ නියුතු බාහිර ණය අය කිරීමේ නිළධාරීන් දෙදෙනකු පොලිස් අත්අඩගුවට පත්ව ඇති අතර මුදල් වංචාවන්ට සම්බන්ධ කලුතර දිස්ත්‍රික් කාර්යාලයේ ස්ථිර සේවයේ නියුතු සේවකයන් සිව් දෙනෙකුගේ සේවය අත්හිටුවා ඇති බවද අමාත්‍යවරයා පවසයි.
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවසන්නේ වංචාකර ඇති සමස්ත මුදල රුපියල් ලක්ෂ හැත්තෑ අටකට අධික බවයි. ඉදිරි විමර්ශණ අනුව මෙම මුදල තවත් වැඩිවිය හැකි බවද එම අධිකාරිය පවසයි.

## වෙරළින් වැඩ ගන්න යයි ...

දෙපාර්තමේන්තුවට උපදෙස් දුන්නේය. එවැනි ස්ථාන දියුණු කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතන මෙන්ම පුද්ගලික අංශයද සම්බන්ධ කරගනිමින් සුදුසු ආයෝජකයන් සොයාගන්නා ලෙසද අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා වැඩිදුරටත් සඳහන් කළේය.
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි. එම ආයතනය විසින් දැනටමත් මෙරට වෙරළ තීරය ආශ්‍රිතව නව සංචාරක ස්ථාන 24 ක් හඳුනා ගෙන තිබේ.
ගශේ වාඩිය, පුත්තලම කලපුව දූපත්, කුඩව, වයික්කාල, මීගමුව කලපුව, කපුන්ගොඩ, ප්‍රීතිපුර, කොක්ගල කලපුව, සීතගල්ල, රැකව කලපුව, ලුනම කලපුව, මලාල ලේවාය, කිරින්ද, කුනුකලේ බීච්, එලිෆන්ට් රොක්, සලතිව් දූපත, තඹලගමුව බේ, ගවනර් ඔෆිස්, උප්පුවේලි, සම්පල්තිව් බීච්, අර්යමල්ල බීච්, නයාරු බීච්, නන්දිකඩාල් බීච්, සන්තකුලම් බීච් මෙලෙස අලුත් හඳුනාගෙන ඇති සංචාරක ස්ථානයන් වේ.
මෙරට වෙරළ පරිසරය ආරක්ෂා කර ගනිමින් රට වටා පිහිටි වෙරළ තීරය විධිමත්ව සංවර්ධන කිරීමෙන් අප රට මුහුණදී සිටින ආර්ථික අර්බුද වලට විසඳුම් සොයාගත හැකි බවද එහිදී අමාත්‍යවරයා වැඩිදුරටත් පෙන්වා දුන්නේය.

මාධ්‍ය ඒකකය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2 වන මහළ
සෙත්සිරිපාය
බත්තරමුල්ල
94 11 286 7163
94 11 286 5479
paper.citynews@gmail.com

# මේක අයාලේ ගිය ආයතනයක්

## දැන් නිසි මඟට ඇවිත්



**දුලිප් විජේසේකර**
**සභාපති**
ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ ආයතනය

**ප්‍රශ්නය -** මෙම ආයතනය ගැන පැහැදිලි කිරීමක් කළොත්?

**පිළිතුරු-** නාගරික සංවර්ධන අධිකාරියේ අනුබද්ධිත ආයතනයක් ලෙස ලංකා රෙස්ට් හවුස් සමාගම හඳුන්වා දෙන්න පුළුවන්. මෙය 2007 පිහිටුවපු ආයතනයක්. අපිට උතුරු නැගෙනහිර ඇතුළු දිවයිනපුරා රෙස්ට් හවුස් තිබෙනවා. නමුත් බොහෝමයක් විනාශවෙලා. පාවිච්චි කළ හැකි මට්ටමේ පවතින්නේ තානායම් 31 ක් පමණයි. ඉන් රත්නපුර, මාතර,පේරාදෙණිය ඇතුළු තානායම් 25ක් ක්‍රියාත්මක වෙනවා. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා අමාත්‍යාංශය භාර ගන්නකොට මේ ආයතනයේ විගණන නිලධාරියෙක්වත් හිටියේ නෑ. පසුගිය වසරේ ජූලි මාසයේ සිට විගණන නිලධාරියෙක් අපේ ආයතනයට පැමිණියා. ඒ නිසා මතුව තිබුණ ගැටළු රැසක් විසඳාගන්න අපිට පුළුවන් වුණා. එක එක්කෙනා තම තමන්ට ඕන විදියට වැඩකරපු තැනක්. මේ ආයතනය ආයාලේ ගිය ආයතනයක්. ගිය වසරට පමණක් ගණකාධිකාරීවරු 05 දෙනෙකු මාරු වී තිබෙනවා. ඇමති ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා හා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සහයෝගයෙන් මෙම ආයතන හොද තැනකට ගන්න අපිට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

**ප්‍රශ්නය -** රෙස්ට්ටූරන්ට්, තානායම් කිව්ව ගමන්ම බොහෝ දෙනෙක්ගේ හිතේ ඇති වෙන්නේ වැරදි චිත්‍රයක්. මේ ආකල්පය බිඳ දමලා වැඩ කරන්නේ කොහොමද?

**පිළිතුරු-** ඔව්... දැන් තියෙන්නේ අලුත් ලෝකයක්. පැරණි සංකල්පවල නොයිඳ අපි අලුත් මනසින් මේ ලෝකය දිහා බලන්න ඕන. ඒ නිසා පැරණි ආකල්ප මතම හිඳලා ජීවත්වෙන්න අමාරුයි. මම හිතන්නේ අලුත් පරම්පරාව මේ දේවල් දිහා අලුත් විදියට බලනවා. ඒ සංස්කෘතික පැත්තෙන්. ඒ වගේම සෞඛ්‍ය පැත්තෙනුත් අපිට ඔය ප්‍රශ්නය දිහා බලන්න පුළුවන්. අපේ යටතේ තිබෙන රෙස්ට්ටූරන්ට්, තානායම් මනාව පාලනය වෙනවා. ඒවයේ විනය ඉතාම උසස් තැනක තිබෙනවා. සේවකයන් වුනත් ඉහළම සුදුසුකම් තියෙන අය ඉන්නේ. පාරිභෝගිකයාට ඉතාම හොඳ සේවයක් ලබාදෙන්න අපි නිරන්තරයෙන්ම කටයුතු කරනවා. තානායම කිව්ව ගමන්ම අපේ හිතේ මැවෙන කෑම වට්ටෝරුවක් තියෙනවා. ඒ තමයි කරවල බැඳුම, මිරිස් හා පපඩම් බැඳුම, මැල්ලුම,සම්බෝලය, රතු සහ සුදු හාලේ බත්, මළු හා මස් වෑංජනය.

**ප්‍රශ්නය -** පෞද්ගලික අංශය සමඟ තරඟයක් දෙන්න පුළුවන්ද?

**පිළිතුරු-** දැන් ගස් ගල් ගානේ කාමර තියෙනවා. අපිට තරඟයක් තියෙනවා. නමුත් යම් තරමකට වෙනස්. අපි සල්ලි පස්සෙම දුවන්නේ නැහැ. නමුත් අපි මේ ආයතන රජයට බරක් නොවී පවත්වාගෙන යන්න ඕන. ඒ නිසා අපි පුද්ගලික අංශය සමඟ ගිවිසුම්ගතවෙලා තානායම් පවත්වාගෙන යන්නත් කටයුතු කරනවා. ඒ අනුව සංචාරක ආකර්ෂණය ඇති තැන්වල තවත් තානායම් 100ක් ආරම්භ කරන්න අපි කටයුතු කරනවා. ඒ සඳහා ඉදිරියේදී කැබිනට් අනුමැතිය ලබාගැනීමටත් නියමිතයි. ඒ සියල්ලම තානායම නමින් මෙම වසරේදීම පටන් ගන්න කටයුතු කරනවා.

**ප්‍රශ්නය -** කොරෝනා වයිරස ව්‍යාප්තිය, රට මුහුණදී සිටින ආර්ථික අර්බුධ නිසා තානායම් පවත්වාගෙන යන්න පුළුවන්ද?

**පිළිතුරු-** ඔව්. එහෙම ගැටළුවක් තියෙනවා. අර්බුධ කියන ඒවා ඇති වෙනවා. මේ නිසා ආපේ ආදායම් තත්ත්වයට දැඩි බලපෑමක් ඇති වුණා. නමුත් අභියෝගවලට මුහුණදීලා ඒවා නිසි පරිදි කළමනාකරණය කරගන්න අපි කටයුතු කරනවා.

අමිල දර්ශන හේරත්

# අපි සේවය ලබා දෙන්නේ රජයේ ආයතන සඳහා පමණයි.



**කේ.ජී. සන්ධ්‍යා කුමුදිනි**
**අධ්‍යක්ෂ ජනරාල්**
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 වසරේදි රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් වෙන් වෙලා වෙනමම දෙපාර්තමේන්තුවක් බවට පත්ව තිබෙනවා. එතැන් සිට මෙම දෙපාර්තමේන්තුවට රජයේ සියලුම ආයතනවල ඉදිකිරීම් කටයුතු, නඩත්තු කටයුතු හා වැඩිදියුණු කටයුතු කරන්න මුදල් රෙගුලාසි හරහා බලතල ලබා දී තිබෙනවා.

අපේ ප්‍රධාන කාර්යාලය සෙත්සිරිපායේ පිහිටා තිබෙනවා. ඊට අමතරව ප්‍රධාන කලාප කාර්යාල 07 ක් රට පුරා ස්ථාපිත කර තිබෙනවා. ඉන් කාර්යාල 2 ක් කොළඹ දිස්ත්‍රික්කය තුළත්, අනෙක් කාර්යාල 5 කුරුණෑගල, ගාල්ල, මහනුවර, යාපනය, මඩකලපුව දිස්ත්‍රික්ක වලත් පිහිටා තිබෙනවා. මෙම කාර්යාලවල දැනට 495 ක කාර්ය මණ්ඩලයක් සේවය කරනවා.

අපි සේවය ලබා දෙන්නේ රජයේ ආයතන සදහා පමණයි. ඒ අනුව රජයේ සියලුම ගොඩනැගිලි සදහා තාක්ෂණික දැනුම හා උපදේශන සේවාව ලබා දීමේ සම්පූර්ණ බලතල අපිට පැවරී තිබෙනවා. ඇතැම් ආයතන අපෙන් සම්පූර්ණ සේවය ඉල්ලනවා. එවැනි අවස්ථාවක ගොඩනැගිල්ල ඉදිකිරීමේ සිට එය අවසන් කර ඔවුන්ට භාර දෙන තුරු සියලුම කටයුතු අපි විසින් සිදු කර දෙනවා. එහිදී වාස්තු විද්‍යා සැලසුම් හා ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම, අනුමැතීන් ලබා ගැනීමට සහය වීම ඇතුළු සියලුම කාර්යයන් අපි ඔවුන්ට සිදුකර දෙනවා.

ඇතැම් ආයතන කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ කටයුතු තනියම සිදු කර ගන්නවා. නමුත් සමහර ආයතන ඒ සදහා අපෙන් උදව් ඉල්ලනවා. එවිට අපි එම ප්‍රසම්පාදන කටයුතු ඔවුන්ට සිදු කර දෙනවා. සේවාදායක ආයතනයට භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් අපේ දෙපාර්තමේන්තුවට ලබා ගැනීමේ විශේෂ අයිතියක් අපිට තිබෙනවා. ඒ සදහා වෙනම ගිණුමක් තිබෙනවා. සමහර විට ඇතැම් ආයතන අපෙන් තත්ත්ව වාර්තා ඉල්ලනවා. එවිට අපි එම වාර්තා ලබා දීමත් සිදු කරනවා. ඒ වගේම විශ්ව විද්‍යාල හා කාර්මික විද්‍යාලවල සිසුන්ට අවශ්‍ය තාක්ෂණික ප්‍රායෝගික පුහුණුව ලබා දීමත් අපේ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබනවා. අපිට බලතල තිබෙන්නේ වරකට සිසුන් 25 දෙනෙකු පුහුණු කිරීමට පමණයි. ඔවුන්ගේ පුහුණු කාලසීමාව අදාළ පාඨමාලාව අනුව වෙනස් වෙනවා.

තැපැල් දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යංශය, කම්කරු දෙපාර්තමේන්තුව, උසාවි සංකීර්ණවල නව ඉදිකිරීම්, නඩත්තු කටයුතු ඇතුළු ව්‍යාපෘති කිහිපයක් අපි විසින් දැනට සිදු කරමින් සිටිනවා. බොහෝ රාජ්‍ය ආයතනවල නව ඉදිකිරීම් කටයුතු දැනට සිදු නොවන නිසා නඩත්තු කටයුතු වැඩි වශයෙන් අපි විසින් සිදු කරනු ලබනවා. තෙල්දෙණිය උසාවි සංකීර්ණය හා කටාන පොලීසිය ඉදිකිරීම, මහනුවර තැපැල් කාර්යාලය අළුත්වැඩියා කටයුතු සිදු කිරීම ඉන් කිහිපයක්. හුංගම සහ ඇඹිලිපිටිය පොලීසියේ ඉදිකිරීම් කටයුතු ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිතයි. දැනට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරෙන්නේ මෙවැනි කටයුතු පමණයි.

නිහාර චාමික පෙරේරා

CityNEWS
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING











# කොළඹ සුපිපෙන නෙළුම

දකුණු ආසියාවේ උසම සන්නිවේදන කුළුණ ලෙස විරුදාවලිය ලැබූ කොළඹ නෙළුම් කුළුණ ලොව හමුවේ අපේ අනන්‍යතාවය පිළිබිඹු කරන සංකේතාත්මක සන්ධිස්ථානයකි. මෙම අපූරු නිර්මාණය කොළඹ නගර මධ්‍යයේ ඉදිකර ඇත්තේ ශ්‍රී ලාංකීය හූ දර්ශනයට නව අත්දැකීමක් එක් කරමිනි. එහි ආකෘතිය මෙරට බෞද්ධ ජන සමාජයට වඩාත් සබඳතාවක් ඇති නෙළුම් මලෙන් උත්තේජනය වී ඇති අතර එමගින් අපේ පැරණි සංස්කෘතික උරුමය මොනවට කියා පායි.

මීටර 350 ක උසින් යුතු නෙළුම් කුළුන ලෝකයේ 18 වැනි උසම කුළුනද වෙයි. කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ බේරේ වැව අසළ වර්ග මීටර් 30,600 ක භූමියක මෙය ඉදි කර තිබේ. තට්ටු 17 කින් යුතු නෙළුම් කුලුන විදුලි සංදේශ කෞතුකාගාරයකින්, 600 දෙනකුට ආසන පහසුකම් ඇති කැරකෙන ආපන ශාලාවකින්, නිරීක්ෂණ මහළකින්, ආසන 1,000 කින් යුතු උත්සව ශාලාවකින්, හෝටල් පහසුකම්වලින් හා ප්‍රදර්ශන පරිශ්‍රයකින් සමන්විතය. වාහන 200 ක් පමණ නතර කිරීමේ පහසුකම් සහිත රථගාලක් ද මෙහි ඉදිකර තිබේ.

නෙළුම් කුළුණ ප්‍රධාන කොටස් පහකින් සමන්විත වන අතර අත්තිවාරම, පාදම, පතුවළ, පිපෙන පෙති සහ ඇන්ටෙනා කුඹරය එම කොටස් වේ. කුළුණේ වේදිකා පරිශ්‍රය මහල් පහකින් සමන්විත අතර කුලුනේ ප්‍රධාන කොටස (ටවර් හවුස්) මහල් අටකින් සමන්විත වේ. කුළුනේ කුඹ ගස කොටස මීටර් 86.9 කින් සමන්විත වන අතර මෙම කොටස රූපවාහිනී, ගුවන් විදුලි සහ අනෙකුත් දුරකථන සන්නිවේදන ඇන්ටනාවලින් සමන්විතය. මෙහි සුවිශේෂී හැඩය සහ පිපෙන පෙති මගින් ආකර්ශනීය දර්ශනයක් නිර්මාණය කර තිබේ.

කොළඹ නගරය සඳහා නවීන සන්නිවේදන පහසුකම් සපයන සුවිශේෂී ව්‍යුහයක අවශ්‍යතාවය හඳුනා ගැනීමත් සමග 2012 වසරේ ජනවාරි මස 20 වැනිදා නෙළුම් කුළුණේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කෙරිණි. වසර ගණනාවක සූක්ෂම සැලසුම් සහ ඉදිකිරීම් වලින් පසුව, ශ්‍රී ලංකීය සංවර්ධනයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් කොළඹ නෙළුම් කුළුණ 2019 වසරේ සැප්තැම්බර් මස 16 වනදා විවෘත කරන ලදී. චීන සමාගමක් විසින් ශ්‍රී ලාංකික ඉංජිනේරුවන්ගේද සහය ඇතිව ඉදි කළ මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර ඇති මුදල අමෙරිකානු ඩොලර් මිලියන 104 කි.

**තට්ටු 17 කින් යුතු නෙළුම් කුළුන විදුලි සංදේශ කෞතුකාගාරයකින්, 600 දෙනකුට ආසන පහසුකම් ඇති කැරකෙන ආපන ශාලාවකින්, නිරීක්ෂණ මහළකින්, ආසන 1,000 කින් යුතු උත්සව ශාලාවකින් සමන්විතය.**

නෙලුම් කුළුනේ ප්‍රධාන ආදායම් මාර්ගය සංචාරක කර්මාන්තය වේ. දැනටමත් දෙස් විදෙස් සංචාරකයින් රැසක් දිනපතා මෙය නැරඹීමට පැමිණෙන අයුරු දැකිය හැකිය. අද වන විට මෙය සෑම වයස් කාණ්ඩයකම අමුත්තන්ට පහසුකම් සැලසීම සඳහා බොහෝ සංස්කෘතික හා විනෝදාත්මක පහසුකම් සපයන ස්ථානයක් බවට පත්ව තිබේ. කොළඹ නෙළුම් කුළුණ දැඩි ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූලව නරඹන්නන්ගේ ආරක්ෂාව සහතික කරන අතරම කුළුණෙහි අති නවීන ආරක්ෂක පද්ධති ඇති අතර ආරක්ෂිත සහ විනෝදජනක අත්දැකීමක් සහතික කිරීම සඳහා පුහුණු කාර්ය මණ්ඩලයක් එහි සේවයේ යොදවා තිබේ.

කොළඹ නෙළුම් කුළුණේ එක් විශේෂත්වයක් වන්නේ එහි නිරීක්ෂණ තට්ටුව ආකර්ෂණීය උසකින් පිහිටා තිබීමයි. නගරයේ වාස්තුවිද්‍යාත්මක තේජස සහ ස්වභාව සෞන්දර්යය පිළිබඳ අද්විතීය දර්ශනයක් ඉදිරිපත් කරමින් කොළඹ සහ ඒ අවට පරිසරයේ විශ්මයජනක දසුන් නරඹන්නන් මවිතයට පත් කරයි. නෙළුම් කුළුණ ලොව පුරා නරඹන්නන් ආකර්ෂණය කර ගනිමින් ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රය නංවාලීම සඳහා ප්‍රධාන සංචාරක ආකර්ෂණීය ස්ථානයක් බවට පත්ව තිබේ. එය මෙරට ආර්ථිකය ශක්තිමත් කිරීමටද දායකත්වයක් සපයනු ලබයි.

කොළඹ නෙළුම් කුළුණ ශ්‍රී ලංකාවේ වාස්තුවිද්‍යාත්මක කුසලතාව, සංස්කෘතික උරුමය සහ තාක්ෂණික දියුණුව පිළිබඳ දීප්තිමත් උදාහරණයකි. මෙම තේජාන්විත ව්‍යුහය ජාතියේ ප්‍රගතිය සහ අභිලාෂයන් සංකේතවත් කරන අතර එය දෙස බලන සියල්ලන්ගේ සිත් ඇද බැඳ ගනී. කුළුණෙහි කලාත්මක නිර්මාණ, සංස්කෘතික වැදගත්කම සහ තාක්ෂණික නවෝත්පාදනයන්ගේ සම්මිශ්‍රණය නිසා කොළඹ නගරය විචිත්‍රවත් අයුරින් ගවේෂණය කිරීමට කැමති ඕනෑම කෙනෙකුට එය නැරඹිය යුතුම ගමනාන්තයකි.

**නෙළුම් කුළුණ ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රය නංවාලීම සඳහා ප්‍රධාන සංචාරක ආකර්ෂණීය ස්ථානයක් බවට පත්ව තිබේ.**

ඡායාරූප - නලින් හේවාපතිරණ
සරත් ජයතිලක

නිහාර චාමික පෙරේරා

# විසුම්පායට අලුත් හිස්වැස්මක්

කොළඹ නගරය මධ්‍යයේ, එනම් කොළඹ 02, ලිලී විදියේ පිහිටි අක්කර හතරකින් යුත් භූමියක පිහිටා ඇති විසුම්පාය වර්ෂ 1835 අගෝස්තු 24 වන දින විලියම් රජු විසින් යටත් විජිත සමයේදී ඉදිකරන ලද්දකි. විදේශීය ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ඉදි වී ඇති මෙම ගොඩනැගිල්ල මුලින්ම හඳුන්වනු ලැබුවේ ඇක්ලන්ඩ් හවුස් (Acland House) වශයෙනි. පසුව බොහෝකලක් යනතුරු මෙම ගොඩනැගිල්ල ලංකා රයිෆල් රෙජිමේන්තු නිලධාරීන්ගේ නේවාසිකාගාරය ලෙස භාවිත කර තිබුණි.

වසර 190ට ආසන්න ආයුකාලයකින් යුතු විසුම්පාය කොළඹ නගරය මැද පිහිටි පෞරාණික වටිනාකමකින් යුතු ගොඩනැගිල්ලකි. විසුම්පාය බොහෝ කාලයක් රාජ රාජ මහාමාත්‍යාධීන්ට සෙවණ දුන් ප්‍රභූ පැලැන්තියේ පා පහස ලත් අතිශයින්ම කාර්ය බහුල ස්ථානයකි.

මේ අතර මෙම සුවිසල් ගොඩනැගිල්ල තමන්ගේ නිල නිවාසය බවට පත්කරගත් දේශපාලනඥයෝ ද වෙති. සිරිමාවෝ බණ්ඩාරනායක, දි.මු. ජයරත්න, අනුරුද්ධ රත්වත්තේ, ලක්ෂ්මන් කදිරගාමර්, මංගල සමරවීර, මහාචාර්ය ජී, එල්. පීරිස් යන අය වරින් වර මෙම සුවිසල් ගොඩනැගිල්ල එසේ නිල නිවාසය වශයෙන් තෝරාගෙන තිබිණි.

ඒ විසුම්පායේ අතීත කතාවයි. මේ ඇරඹෙන්නේ විසුම්පායේ වර්තමාන කතාවයි.

කොළඹ නගර මධ්‍යයේ පිහිටා තිබුණද විසුම්පාය ගොඩනැගිල්ල සහිත මෙම භූමිය අතිශයින්ම නිස්කලංකය.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි පෞරාණික වටිනාකමක් සහිත ඉඩම් සහ ගොඩනැගිලිවල පෞරාණිකත්වයට හානි නොවන ලෙස ආයෝජන සඳහා යෙදවීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක වේ. විසුම්පාය ගොඩනැගිල්ල සුපිරි හෝටලයක් බවට පත් කරන්නේ එම වැඩසටහනේ යටතේයි.

ඒ අනුව රාජ්‍ය නායකයින් රැසකගේ නිල නිවස ලෙසද කලක් භාවිතා කරන ලද "විසුම්පාය" සුපිරි හෝටලයක් (Boutique Hotel) බවට පත් කිරීමට නියමිතය.

ඊට අදාල අවබෝධතා ගිවිසුමට නාගරික සංවර්ධන අධිකාරිය සහ Azotels Hospitility limited ආයතනය නාගරික සංවර්ධන අධිකාරි ශ්‍රවණාගාරයේදී පසුගිය (07) අත්සන් තැබුහ.










එම ගිවිසුමට අත්සන් තැබුවේ නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති නිමේෂ් හේරත් මහතා හා හොංකොන් Azotels Hospitility limited ආයතනයේ සභාපති ඒඩ්‍රියන් සෙචා (Adrian Zecha) මහතායි.

විසුම්පාය ගොඩනැගිල්ල Azotels Hospitility limited ආයතනය වෙත වසර 50ක බදු පදනම යටතේ පවරා ඇත. Azotels Hospitility limited ආයතනය, හුනාස් හෝල්ඩින් පුද්ගලික සමාගම, ජපානයේ හවුල්කාර කොස්ටියුම් (Consortium) සමඟ මෙය සුපිරි හෝටලයක් ලෙස පවත්වාගෙන යනු ඇත.

රටේ තිබෙන ආර්ථික තත්ත්වය පදනම් කර ගනිමින් මෙවැනි පෞරාණික ගොඩනැගිලි පුද්ගලික හා පොදු හවුල්කාරීත්වය යන ක්‍රමයට මෙරට මහජන මුදල් වියදම් නොකර සංවර්ධනය කිරීම මෙහි අරමුණයි.

පරිසර හිතකාමී ඉහළ මට්ටමේ බුටික් හෝටලයක් (Boutique Hotel) ලෙස මෙය සංවර්ධනය කෙරෙන අතර මෙහි ඉහළ මට්ටමේ සංචාරකයින් වෙනුවෙන් නවාතැන් ගැනීම සඳහා සුඛෝපභෝගී කාමරද, පොදු ප්‍රදේශ හා අවන්හල්වලින් සමන්විතය.

යටත් විජිත සමයට අයත් වූ විසුම්පාය ව්‍යාපාර පවරා ගැනීමේ පනතේ 35 වැනි වගන්තිය යටතේ 1971 වර්ෂයේදී රජය සතු දේපළක් ලෙස රජයට පවරා ගනු ලැබීය.

විසුම්පාය කොළඹ පිහිටා ඇති සුන්දර ගොඩනැගිල්ලකි. මේ නිසාම බොහෝ රාජ්‍ය තාන්ත්‍රික නායකයන්ගේ තාවකාලික නවාතැන්පොළ ලෙසද මෙම ඇක්ලන්ඩ් හවුස් ගොඩනැගිල්ල භාවිත විය. ඉන්දිරා ගාන්ධි, ලංකාවට පැමිණි අවස්ථාවේදී ඇයගේ නවාතැන වූයේද විසුම්පායයි.

විසුම්පාය ගොඩනැගිල්ලේ සුවිශේෂී නිමැවුමට කිසිදු හානියක් සිදු නොවන අයුරින් මෙය සංවර්ධනය කෙරේ.

විසුම්පායේ ගෙමිදුලේ ඇති විශාල ඉඩකඩ එළිමහන් ප්‍රසංග සඳහාත් විවාහ උත්සව සඳහාත් වෙන් කෙරෙනු ඇත.

ඒ අනුව මෙතෙක් කල් ප්‍රභූ පැලැන්තියට පමණක් සීමාවී තිබූ විසුම්පාය සාමාන්‍ය පොදු මහජනතාව උදෙසාද විවෘතව පවතිනු ඇත. තවද විසුම්පායේ තේජස් බව තවත් චිරාත් කාලයක් එලෙසම පවතිනු ඇත


සිරිමාවෝ බණ්ඩාරනායක


දි.මු. ජයරත්න


අනුරුද්ධ රත්වත්තේ


ලක්ෂ්මන් කදිරගාමර්


මංගල සමරවීර


මහාචාර්ය ජී, එල්. පීරිස්

නාලක දහනායක

# ඇහැලේපොළ වළව්ව



මහනුවර ස්වර්ණ කල්‍යාණ වීදියට එහෙමත් නැතිනම් වර්තමානයේ රජ වීදියට මුහුණ ලා පිහිටි ඇහැලේපොළ වලව්වත් කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමන්ගේ කාලයේ ඉදිවුවක් කියලයි ඉතිහාසයේ ලියවිලා තියෙන්නේ. රජකාලේ නුවර පිහිටලා තිබුනේ වලව් 18 න් එකක් විදියට ඇහැලේපොළ වලව්ව හඳුන්වලා දෙන්න පුළුවන්. ඒ වගේම මේ වනතෙක්ම විනාශයට පත් නොවී අතීත ගාම්භීරත්වය රැකගෙන පවතින ප්‍රධාන වලව්වක් විදියටත් මේ ඇහැලේපොළ වලව්ව පෙන්වා දිය හැකිය.

මාතලේ දිස්ත්‍රික්කයේ ඇහැලේ පොළ නම් ග්‍රාමය ඇහැලේපොළ නිළමේතුමාගේ නිජබිම විය. එය මාතලේට සැතපුම් 12 ක් උතුරු දෙසින් පිහිටා ඇත. ඇහැලේපොළ අදිකාරම ක්‍රි.ව 1773 දී උපන් බවට ඉතිහාසය සාක්ෂි දරයි. එතුමාගේ භාර්යාව වූයේ ඌවේ කැරැල්ලේ නායකත්වය ගත් වීර කැප්පෙටිපොළගේ නැගෙණිය වූ මොනරවිල කුමාරිහාමිය. පිළිමතලව්වේ අදිකාරම එතුමාගේ මාමා විය.

මහනුවර නගරයේ ආරක්ෂාව පැවැතුණේ ප්‍රධාන අධිකාරම්වරු යටතේය. ස්වර්ණ කල්‍යාණ වීදියේ උතුරු කොටස මහා අධිකාරම් යටතේ ද පැවැතිණ.

ඇහැලේපොළ අධිකාරම්ධුරය පිරිනැමෙන උත්සවයට පැමිණ සිටි ඇහැලේපොළ කුමාරිහාමි දැකීමෙන් රාජසිංහ රජුට ඇය කෙරෙහි මහත් ආලයක් හටගෙන ඇත. දිනක් රෑ කුමාරිහාමි හමුවන්නට ඇහැලේපොළ වලව්වට ගිය රාජසිංහ රජතුමා ඇය කෙරෙහි හටගත් ආලය පිළිබඳ විස්තර කොට ඇත. රජුගේ ඉල්ලීම පිළිකෙව් කළ ඕ තොමෝ තමාගේ ස්වාමියාගෙන් තොර සැපයක් නැතැයි කීවේලු. රජු කෝප වන්නට ඇත්තේ මේ හේතුව නිසා යැයි ජන ප්‍රවාදය කියයි. රජු ඇහැලේපොළ නිළමේට උසස්වීම් ආදිය දීමෙන් කුමාරිහාමිගේ සිත් දිනා ගැනීමට උත්සහ කළා යැයි ජන වහරින් කියැවේ.

ඇහැලේපොළ වළව්ව 1818 මාර්තු 27 මිනින්දෝරු දෙපාර්තමේන්තු සිතියම මගින් සළකුණු කොට තිබෙනවා. මහනුවර රාජධානියේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජ සමයේ මහ අධිකාරම් සහ සබරගමුව දිසාවේ ලෙසට (1811 - 1814) රාජකාරී ඉටුකල ඇහැලේපොළ නිළමේ විසින් තම රාජකාරී උදෙසා මෙම මන්දිරය ඉදිකරවා ඇත. ඇහැලේපොල අදිකාරම මුරුසි දිවයිනට පිටුවහල් කරනු ලැබූ අතර 1829 දී මරණයට පත්ව ඇත.

ප්‍රතාපවත් පෙනුමකින් යුත් මෙම ගොඩනැගිල්ල ඉදිරිපස විශාල අංගණයක්ද වටේට ආරක්ෂිත දිය අගලක් ද තිබූ බවට සාධකයන් ඇත. දැනට මෙහි පිවිසෙන දොරටුව එකල පිටු පස ලෙස භාවිත කර ඇත. එම කොටසෙහි අශ්වගාල, ආහාර ගබඩා සහ මුළුතැන් ගෙවල් වේ. එය වර්තමානයේ නව කාර්යාල ගොඩනැගිල්ල හා ගබඩා කාමර වේ.

ඉපැරණි ගඩොල්වලින් ශක්තිමත් කොට සිංහල උළු සෙවිලි කර ඇති ඇහැලේපොළ වලව්ව ඕලන්ද ගෘහ නිර්මාණ ශිල්පයේ ආභාෂය අරගෙන තියෙනවා කියලයි ඉතිහාසඥයෝ පෙන්වා දෙන්නේ.

වලව් ගොඩනැගිල්ලේ තියෙන ආරක්කු සහ කුළුණුත් ඒකට සාක්ෂි දරනවා. ඒ වගේම අද දක්වාම තවමත් නොනැසී පවතින ඇහැලේපොළ වලව්වේ ඉහල මාලයේ ලී තරප්පු මන්දිරය, ඇතුලත දොර උළුවහු ලාංකීය ගෘහ නිර්මාණ ශිල්පියේ අපූර්වත්වයත් පෙන්වා දෙති.

නාලක දහනායක

එය පසුකාලීනව ඇහැලේපොළ වලව්ව, රිමාන්ඩ් බන්ධනාගාරය හා බන්ධනාගාර නිල නිවාසය ලෙස ගොඩනැගිලි තුනකින් සමන්විතව තිබිණි. ඓතිහාසික ඇහැලේපොල වලව්ව මහනුවර ශ්‍රී දළදා මාලිගාව ආශ්‍රිත පූජාභූමි ප්‍රදේශයේ පිහිටා ඇත.

එය 2005 වසරේදී පුරාවිද්‍යා ගොඩනැගිල්ලක් ලෙස ප්‍රකාශයට පත්කර තිබේ. බ්‍රිතාන්‍යය යටත්විජිත සමයේ දී (ක්‍රි.ව.1844) මෙය හමුදා බැරැක්කයක් ලෙස භාවිතයට යොදාගෙන තිබිණි පසුකාලීනව සිර මැදිරියක් හා බෝගම්බර රිමාන්ඩ් බන්ධනාගාරයක් ලෙස මෙම වලව්ව පවත්වාගෙන යනු ලැබිණි. මෙහි ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම්වරයාව සිටි සමයේදීය. නැතහොත් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ සමයේදීය.

මහනුවර නගර සංවර්ධන සැලැස්ම යටතේ ඇහැලේපොළ වලව්ව නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරනු ලැබුණි. මෙම ඓතිහාසික ඇහැලේපොළ වලව්ව තවදුරටත් රිමාන්ඩ් බන්ධනාගාරයක් ලෙසින් පවත්වාගෙන යෑම අපරාධයක් බව අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ තීරණය විය . ඔහු මෙම ගොඩනැගිල්ලේ වටිනාකම පිළිබඳවත් එහි ආරක්ෂාව පිළිබඳවත් ගැඹුරින් අධ්‍යයනය කොට මහජන සුබසෙත පිණිස රැක ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී.

අනතුරුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙහි ප්‍රතිසංවර්ධන කටයුතු ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත 2014 දී භාර දෙනු ලැබිණි. ඒ අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් හා මෙහෙයවීම් මත නාගරික සංවර්ධන අධිකාරියේ අරමුදලින් රුපියල් මිලියන 154.8ක් වැය කර මෙම වලව්වේ ප්‍රතිසංවර්ධන කටයුතු සිදුකර ඇත.









ඇහැලේපොළ අධිකාරම්තුමාගේ අත්සන

# விசும்பாயவுக்கு புதிய தலைக் கவசம்

கொழும்பு நகரத்தின் மையத்தில், கொழும்பு 02, லில்லி வீதியில் நான்கு ஏக்கர் நிலப்பரப்பில் அமைந்துள்ள விசும்பாய 1835 ஆகஸ்ட் 24 அன்று காலனித்துவ காலத்தில் வில்லியம் மன்னரால் கட்டப்பட்டது. வெளிநாட்டு கட்டிடக்கலைப்படி கட்டப்பட்ட இந்த கட்டிடம் முதலில் அக்லண்ட் ஹவுஸ் (Acland House) என்று அழைக்கப்பட்டது. பின்னர், நீண்ட காலமாக இந்த கட்டிடம் சிலோன் ரைபிள் ரெஜிமென்ட் அதிகாரிகளின் தங்குமிடமாக பயன்படுத்தப்பட்டது.

ஏறக்குறைய 190 வருட ஆயுட்காலம் கொண்ட விசும்பாய கொழும்பின் மையத்தில் உள்ள புராதன மதிப்புமிக்க கட்டிடமாகும். விசும்பாய நீண்ட காலமாக அரச மற்றும் மிக உயர் பிரபுக்களுக்கு நிழல் கொடுத்த அவர்களது நடமாட்டம் நிறைந்த பரபரப்பான இடமாக இருந்தது.

இதேவேளை, இந்த பிரமாண்டமான கட்டிடத்தை தமது உத்தியோகபூர்வ வாசஸ்தலமாக மாற்றிய அரசியல்வாதிகளும் உள்ளனர். ஸ்ரீமாவோ பண்டாரநாயக்க, டி.எம். ஜயரத்ன, அனுருத்த ரத்வத்த, லக்ஷ்மன் கதிர்காமர், மங்கள சமரவீர, பேராசிரியர் ஜி, எல். பீரிஸ் போன்ற அமைச்சர்கள் இந்த பிரமாண்டமான கட்டிடத்தை தமது உத்தியோகபூர்வ இல்லமாக அவ்வப்போது தெரிவு செய்திருந்தனர்.

அதுதான் விசும்பாயவின் கடந்த காலக் கதை. இப்போது தொடங்குகிறது விசும்பாயவின் தற்போதைய கதை.

கொழும்பின் மையத்தில் அமைந்திருந்தாலும், விசும்பாய கட்டிடத்துடன் கூடிய இந்தப் பகுதி மிகவும் அமைதியானது.

நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சர் திரு.பிரசன்ன ரணதுங்கவின் பணிப்புரைக்கு அமைய, தொன்மைக்கு சேதம் ஏற்படாத வகையில், புராதன பெறுமதி கொண்ட காணிகள் மற்றும் கட்டடங்களில் முதலீடு செய்யும் விசேட வேலைத்திட்டம் நடைமுறைப்படுத்தப்பட்டு வருகின்றது.

அந்த வேலைத்திட்டத்தின் கீழ் தான் விசும்பாய கட்டிடம் உயர் ரக ஹோட்டலாக மாற்றப்படும்.

அதன்படி, ஒரு காலத்தில் பல அரச தலைவர்களின் உத்தியோகபூர்வ இல்லமாக பயன்படுத்தப்பட்ட "விசும்பாய" உயர் ரக ஹோட்டலாக (Boutique Hotel) மாற்றப்படவுள்ளது.

இது தொடர்பான புரிந்துணர்வு ஒப்பந்தம் நகர அபிவிருத்தி அதிகாரசபை மற்றும் Azotels Hospitality Limited ஆகியவற்றால் கடந்த (07) நகர அபிவிருத்தி அதிகார சபை கேட்போர் கூடத்தில் கைச்சாத்திடப்பட்டது. இந்த உடன்படிக்கையில் நகர அபிவிருத்தி அதிகார சபையின் தலைவர் திரு. நிமேஷ் ஹேரத் மற்றும் ஹொங்கொங் Azotels Hospitality Limited நிறுவனத்தின் தலைவர் திரு. அட்ரியன் செச்சா (Adrian Zecha) ஆகியோர் கையெழுத்திட்டனர்.









ஸ்ரீமாவோ பண்டாரநாயக்க



டி.எம். ஜயரத்ன



அனுருத்த ரத்வத்த



லக்ஷ்மன் கதிர்காமர



மங்கள சமரவீர



பேராசிரியர் ஜி, எல். பீரிஸ்

விசும்பாய கட்டிடம் 50 வருட குத்தகையின் கீழ் Azotels Hospitality Limited நிறுவனத்திடம் ஒப்படைக்கப்பட்டுள்ளது. Azotels Hospitality Limited நிறுவனம் இதை ஒரு உயர் ரக ஹோட்டலாக ஹுனாஸ் ஹோல்டிங் பிரைவேட் லிமிடெட், ஜப்பானின் பார்ட்னர் சூட் (Consortium) உடன் இணைந்து நடத்தும்.

நாட்டின் பொருளாதார நிலைமையின் அடிப்படையில், நகர அபிவிருத்தி அதிகாரசபையின் பணத்தை செலவு செய்யாமல் தனியார் மற்றும் பொது பங்களிப்புடன் இவ்வாறான பழமையான கட்டிடங்களை அபிவிருத்தி செய்வதே இதன் நோக்கமாகும்.

சுற்றுச்சூழலுக்கு உகந்த உயர்தர ஹோட்டலாக இது உருவாக்கப்படும் மற்றும் உயர்தர சுற்றுலாப் பயணிகள் தங்குவதற்கு ஆடம்பர அறைகள், பொதுவான பகுதிகள் மற்றும் உணவகங்கள் ஆகியவற்றைக் கொண்டிருக்கும்.

1971 ஆம் ஆண்டு வணிகம் கையகப்படுத்துதல் சட்டத்தின் 35வது பிரிவின் கீழ், காலனித்துவ காலத்தைச் சேர்ந்த விசும்பாய அரச சொத்தாக அரசிடம் கையகப்படுத்தப்பட்டது.

கொழும்பில் அமைந்துள்ள ஒரு அழகிய கட்டிடம் விசும்பாய. இதன் காரணமாக, இந்த அக்லாண்ட் ஹவுஸ் கட்டிடம் பல இராஜதந்திர தலைவர்களின் தற்காலிக தங்குமிடமாகவும் பயன்படுத்தப்பட்டது. இந்திரா காந்தி இலங்கை வந்தபோது விசும்பாயவில் தங்கியிருந்தார்.

விசும்பாய கட்டிடத்தின் தனித்தன்மைக்கு பாதிப்பு ஏற்படாத வகையில் இது அபிவிருத்தி செய்யப்படும்.

விசும்பாயவின் முற்றத்தில் உள்ள பெரிய இடம் வெளிப்புற கச்சேரிகள் மற்றும் திருமணங்களுக்கு ஒதுக்கப்படும்.

அதன்படி, இதுவரை உயர சாதியினருக்கு மட்டுமே வழங்கப்பட்டு வந்த இந்த விசும்பாய பொது மக்களுக்கும் திறக்கப்படும். ஆனால் விசும்பயாவின் மகிமை நீண்ட காலத்திற்கு அப்படியே இருக்கும்

/முனீரா அபூபக்கர்

City NEWS
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING

# එන්න යන්න 80 CLUB







මෙරට පෞරාණික වටිනාකමකින් යුත් ඉඩම් හා ගොඩනැගිලි විශාල සංඛ්‍යාවක් කොළඹ හා තදාසන්න ප්‍රදේශ ආසන්නයේ තිබේ. ඒවා මේ වනවිට කිසිවකුගේ භාවිතයට නොගෙන අත්හැර දමා ඇත.
එවැනි ගොඩනැගිලි විනාශ මුඛයට යාමට නොදී එහි පෞරාණිකත්වයට හානියක් නොවන අයුරින් ප්‍රතිසංස්කරණය කර සංවර්ධනය කිරීමේ වැඩසටහනක් මේ වනවිට නාගරික සංවර්ධන අධිකාරිය ආරම්භ කර ඇත.
ඒ අනුව පසුගියදා එසේ ප්‍රතිසංස්කරණය කළ කොළඹ 07 නිදහස් මාවතේ පිහිටි "එයිටි ක්ලබ්" (80 CLUB) ආයතනය මහජනතාව වෙනුවෙන් විවෘත කිරිම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති නිමේෂ් හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරුණි. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ විෂය පථයට අයත් වන නාගරික සංවර්ධන අධිකාරිය සතු බත්තරමුල්ල වෝටර්ස් ඒජ් ආයතනය ඒ සඳහා පහසුකම් සලසයි. එයිටි ක්ලබ්" යනු කොළඹ පැරණිතම සමාජ ශාලාවකි. මහනුවර ක්වීන්ස් හෝටලයේ අංක 80 කාමරයේ සාමාජිකයන් කිහිප දෙනෙකු පළමු රැස්වීම පවත්වා මෙම හෝටලය ආරම්භ කිරීම හේතුවෙන් මෙම සමාජය "එයිටි ක්ලබ්" නමින් හැඳින්වේ. පසු කලෙක එය මෙලෙස කොළඹ 07 නිදහස් මාවතේ ස්ථාපිත කර තිබේ.
1971 කැරැල්ල හේතුවෙන් එවකට රජය මෙම භූමිය ශ්‍රී ලංකා යුද හමුදාවට පවරා දුන්නේය. 1978 රජය යටතේ එයිටි ක්ලබ් සඳහා නැවත අවසර ලැබිණි. 2021 ඔක්තෝම්බර් මාසයේ දී නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගන්නා තුරුම එහි නඩත්තු කටයුතු ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම යටතේ ක්‍රියාත්මක විය. 2020 වසරේදී මෙය රජයට පවරා ගැනීමෙන් අනතුරුව නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහය ඇතිව මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කෙරුණි. ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ රුපියල් මිලියන 411 ක මුදලක් වැය කර ඇත. එමෙන්ම මේ වනවිට රුපියල් මිලියන 23ක ආදායමක් උපයා තිබේ.
ප්‍රතිසංස්කරණ කටයුතු වලින් පසුව මෙය යළි විවෘත කෙරුණේ 2021 වසරේදීය. නව අවන්හල්, රැස්වීම් කාමර සහ පුද්ගලික සිනමා කාමර ඇතුළු නවීනතම එකතු කිරීම් හරහා වර්තමානය වන විට අලංකාරවත් නිමාවක් එයිටි ක්ලබ් සඳහා ලැබී තිබේ.
මෙහි ඇති පහසුකම් තවත් වැඩි දියුණු කරමින් ආගන්තුක සත්කාරයෙන් අනූන වෝටර්ස් එජ් තරු පංතියේ හෝටල් අත්දැකීමක් එයිටි ක්ලබ් ඔස්සේ ලබා දීම රජයේ සැළසුම වී තිබේ.

අමිල දර්ශන හේරත්

# අපේ පාසල අපේ දැතින් සුරකිමු

## අගෝස්තුවේ ඇරඹේ

අගෝස්තු මාසය එන තෙක් දරුවන් අසාවෙන් බලාගෙන සිටින්නේ මාසයකට අසන්න දීර්ඝ පාසල් නිවාඩු කාලයක් ලැබෙන නිසාවෙනි.
එම පාසල් නිවාඩු සමයේදී ගම්පහ දිස්ත්‍රික්කයේ පාසල්වල වහලය, ගොඩනැගිලි, සනීපාරක්ෂක පහසුකම් ආදිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි ගම්පහ කළාප අධ්‍යාපන කාර්යාල විසින් ක්‍රියාත්මක කිරීමට නියමිතය.
"අපේ පාසල - අපේ දැතින් සුරකිමු" අදාළ ව්‍යාපෘතියේ නමයි.
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ සමයේදී පළාතේ පාසල් දියුණුව සඳහා අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබිණ. එය එකල බස්නාහිර පළාතේ ඉතාම සාර්ථකව ක්‍රියාත්මකවූ ව්‍යාපෘතියකි.
මෙහිදී සිදුවන්නේ පාසලේ දූ දරුවන්ගේ දෙමාපියන්, ආදි සිසුන්, ස්වෙච්ඡා සංවිධාන ආදිය සම්බන්ධකර ගනිමින් පාසලේ වහලය, ගොඩනැගිලි, සනීපාරක්ෂක පහසුකම් ආදිය සිදු කිරීමයි. තවත් විදියකින් කිවහොත් ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පාසල සංවර්ධනය කිරීමය.
රට මේ වනවිට ආර්ථික අර්බුධයකට මුහුණදී සිටී. එබැවින් තිබෙන මුදල් කළමණාකරණය කරගනිමින් සංවර්ධන කටයුතු සිදුකිරීමට රජයට සිදුව ඇත.
අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසන්නේ පවතින තත්ත්වය මත ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පාසල් සංවර්ධනය කිරීම ඉතාම කාලෝචිත බවය.







මෙහිදී පාසල් පිංතාරු කිරීම සඳහා අවශ්‍ය තීන්ත වර්ග අඩු මිලට ලබාගැනීම සඳහා වන වැඩ පිළිවෙලක් සම්බන්ධයෙන් තමන් බස්නාහිර පළාත් ආණ්ඩුකාර මාර්ෂල් ඔෆ් ද එයාර්පෝස් රොෂාන් ගුණතිලක මහතා සමග සාකච්ඡා කරන බවය.
ඉගනීම වඩාත් යහපත් වීමටනම් ඉගනුම සිදුවන තැන ඉතා යහපත් තැනක් බවට පත්විය යුතුය. උගන්වන තැන යහපත් පරිසරයක් තිබෙනවිට ඉගෙන ගන්නා දෙය වඩාත් හොඳින් සිතේ ධාරණය වේ. එබැවින් ළමුන්ගේ අනාගතය වෙනුවෙන් මෙවැනි ක්‍රියාවන් අත්‍යාවශ්‍යය.
මෙම වැඩපිළිවෙල සාර්ථක කර ගැනීමෙන් අගෝස්තු පාසල් නිවාඩුව අවසන්ව යළි පාසලට යන දුවා දරුවන්ට ලැබෙන්නේ අපූර්ව අලුත් අත්දැකිමකි.
ඒ අත්දැකීම ඔවුන්ගේ අනාගතයට බලපානු නොවනුමානය.

නාලක දහනායක

# හද අඳිරේඛා

## සුසුම් හෙලා

විසිරුණු තැනිතලාවක
ගිනියම් කාෂ්ටකයට
දිය පොදක්
වැටෙන්නේ
සිය අවුරුද්දක පැවුමකින්නම්
කටු පිරුණු
පතොක් මතත්
මල් පොහොට්ටුවක් පිපුණත්
සමනල්ලු නෑ
උන් ඉගිලිලා ගිහින් ...
දරුණු ලෙස වේලී සුසුම් හෙලා
ඉහළු මී බලනුන්ට
වැහැපන්
දානය හේදෙන්න
අද නැතත් හෙටවත්....

- භාගයා -

## හිතපන්

හෙට ගැන හිතපන් අද පුරන්න කලින් සවුදිය
වැඩිය දැම්මොත් සුදිය ලක්ෂණට සිදෙනවා උඹේ නදිය
රටක ගන්නෙ නැත්නම් අමාරුවෙන් එකතු කරගත්තු පොදිය
මතක තියාගනින් වැඩි ඈතක නෑ නරකාදිය
පිස්සෙක් වගේ මොන්නෙ මජ්පු කරන්නද මොන බාරය
ටික ටික දියවෙලා යනවා උඹ නිසා
උඹට ආදරේ උන්ගෙ සාරය
හැදෙනවා නම් හිතට ගනින් මේ තමයි හොඳම වාරය
සිහියෙන් පදවපං හප්පන්නෙ නැතුව පවුල නැමති කාරය
බෙබදු කම පුරුදු වුණේ හොයන්න නම් ජෝලිය
බීලා බීලා ගෙදර ගිහින් දාන්නෙ ඇති වලිය
අහේතුවකට හටගත්තම නොනිමෙන ගුටි කෙලිය
නිසල යන්නෙ අකාලයේ ජීවිත වල එළිය

- තාරකා -

වෙල් එළියේ දොල පාරේ
කෙළි සෙල්ලම් කල බාලේ
කොළොම් තොටේ හැඩ බලන්න
හරි ආසාවක් තිබුණා

ටික ටික ලොකු වුන කාලේ
ගම රට ගැන දැනෙනා වයසේ
ගෙන්දගම් පොළොවෙ උණුසුම
විඳින්නට උනා

හරි හැටි තේරුන කාලේ
මතකයෙ දිව්වේ පිම්මේ
සිසිල් පවන, නැවුම් සුවඳ
ගම්වල නොවැ හොඳටම තිබුණේ

සිහින මැව්ව සුරපුරයම
මෙහෙම උනේ කොහොමද තාමත්
කොළොම් තොටේ සෙව් නිදහස
මේකද හිතනව තාමත්

හුස්ම ගත්ත ඒ නිදහස
එකට කැටිව විඳි සෙනෙහස
ඊට වඩා සැප පහසුව
කොහොම හොයන්නෙද මේ තොට

ගන්නට හැකි නම් කාලය
ආපසු එන්නම් පිම්මට
හිතන්න ඇත්නම් ඒ ගැන
පතමි සදා ගමක සිරිය.

එස්. නදීකා අබේසේකර
කළමනාකරන සහකාර
ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

## බිම්මල් කැකුළක්

බිම්මල් කැකුළක් සඳට හඬනවා
සඳ ඒ නෑ ඒ කඳුලැලි දුටුවේ
පෙම් මල් පුදින සිතක උපන් දුක
ගල් වුණු හිතකට නෑ දැනුණේ....

නොපිරෙන පැතුමක් දෝත දරාගෙන
ඉකිලන්නටමයි මට හිතුණේ
ලං වෙන්නට බැරි දුරක ඉඳන් නුඹ
මගේ හිතට ඇයි අත වැනුවේ....

සඳ හැඬුවේ නෑ සඳටම පෙම් බැඳි
බිම්මල පර වී ගිය දවසේ
එලෙසින් දිනයක මා මියඇදුණත්
කඳුළු රැඳෙනු නැත ඔබ දෙනෙතේ....

- දිල් -

## සඳට හිමිකම්

සඳට හිමිකම් අහස දැරුවත්
අමාවක රැයවල් ද එනවා....
අයිතියක් නැති බිම්වලත් හරි
ලස්සනට මල් පිපෙනවා...
හීන නොමැතිව ගෙවන රැයවල
හීනියට හිත දවනවා...
නුඹට හිමිකම් නැතිවුවත් මට
අදත් ආදරෙ හිතෙනවා

- උපුටා ගැනීමකි -

## සෙනෙහස

අත පොවන දුර
පිපුනු මල් වල
හිත සොයන හැඩ තිබුනෙ නෑ
දුරින් දුර තුරු
මුදුන් වල පිපි
මල් තරම් හිත බැඳුනෙ නෑ
නෙලා නොගෙනම
සුවඳ වින්දට
ඇබින්දක් හිත රිඳුනෙ නෑ
දැනුන තැන් වල
මිසක සෙනෙහස
උරුම තැන් වල සුවඳ නෑ

- උපුටා ගැනීමකි -

## අඹ මල

සුදෝ සුදුවන් කුඩා මලක් වූ අඹ මල
සෞම්‍ය මිහිරි ගන්ධයකි මට නුඹ ලඟ
වසත් සමය පැමිණි බව දැනේ මට එය ලඟ
බලා සිටිමි දින ගැන රසය විඳින්න මා හට

මී මැසි සමලුන් සැරිසරයි මල වට
ආසයි බලා සිටින්න නුඹ ගැන මට
පල දරා අතු බරව සිටින අඹ ගහ හට
කාලය එලබිනි එහි රස විඳින් නට

- ශිහාරා -

මේ පිටුව ඔබගේය.
ඉතිං ඔබගේ සිතෙහි මැවෙන අලුත් අදහස්, කවි විතරක් නොව නිසඳැස්වලටත් මේ පිටුවේ ඉඩ ඇත.
ඔබේ නිර්මාණ අපිට එවන්න...
වට්සප් අංකය - 0773135594

City NEWS
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING
Magazine



ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ජාතික මහෝත්සවය වන ජාතික ඉදිකිරීම් සම්මාන උළෙල (2020/2021) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා කොළඹ සව්සිරිපායේ පිහිටි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේදී පැවැත්විණ.

ගංවතුර පාලනය කිරීමේ අරමුණින් කොළඹ නගරයේ ඇළවේලි හා වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියක් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි ඉඩම් සංවර්ධන සංස්ථාව විසින් ආරම්භ කර තිබේ.

ඡායාරූප
නුවන් දිනේන්ද්‍ර
නලින් හේවාපතිරණ

ඡායාරූප
නුවන් දිනේන්ද්‍ර